


**සංස්කරණය ලක්ෂ්මන් කොඩිතුවක්කු**

ඕස්ට්‍රේලියාවේ රටුන් නැත. සිටින්නේ සංක්‍රමණය වූ නොරටුන් ය. ආදි වාසී රටුන් පවා අද ජීවත් වන්නේ නොරටුන් මෙනි. එදා අප රටෙන් සංක්‍රමණය වී නොරටුන් මෙන් ජීවත් වීමට හිත් ඉඩ නාදුන් කීප දෙනෙක් එක් වී අපේ පුංචි රට නැවත මෙරටට එක් කර ගැනීමට කල්පනා කළ හ. ඔවුහු කුඩා සංගමයක් බිහි කළ හ. එය සිංහල සංස්කෘතික හමුව නම් විය. අද සිඩ්නි නුවර සිංහල සංස්කෘතික හමුවටත් එමගින් ආරම්භ කළ සිංහල පාසල් ව්‍යාපෘතියටත් වසර 15 ක් සපිරී ඇකත එම වසර 15 ක පරාසය තුළ මෙරට ශ්‍රී ලාංකික දරු දැරියන්ගේ සිංහල භාෂාවේ වර්ධනය හා එහි ප්‍රතිඵල ගැන කතා කරන විට අද අපට සතුටු කඳුළු හෙළිය හැකි ය.

## 15 වසරක් සපුරණ අපේ සිංහල පාසල

මුල් කලෙක සිඩ්නි නුවර ආරම්භ කළ "රස ක්බන්බ්"දජස්එසදබ නම් සංගමයෙන් බිඳී ආ ඩොන් වික්‍රම, සෝමරත්න දිසානායක, සන්දනායක වැන්නවුන්ගේ මූලිකත්වයෙන් බිහි වූ මෙම සිංහල සංස්කෘතික හමුව මුලින්ම කලේ ඉතා විශේෂ ප්‍රසංගයක් ලංකාවෙන් ගෙන්වා ජනතාවට රස වින්දනය ලබා දීමයි. එය වික්ටර් ගේ ස ප්‍රසංගයයි. එවැනි කලා කටයුතු වල නියැලෙමින් ප්‍රජාවට සේවාවක් කළ සංගමය දරු දැරියන් කිහිප දෙනෙකු සහභාගි කරවාගෙන උතුරු පැරමටා හි විහාල පාසලක් ආරම්භ කළහ. මෙය සිඩ්නි හි සිංහල භාෂාවේ ප්‍රවර්ධනයට දැමූ මූලික අඩිතාලමක් විය. ස්වේච්ඡාවෙන් වැඩ කළ ගුරුවරු පිරිසක්ද එයට දායකත්වය සැපයූ දෙමාපියන්ගේ ද බලවත් උනන්දුවෙන් හා කැපවීමෙන් ඉදිරියට ගෙනගිය මෙයට ක්‍රම ක්‍රමයෙන් සිංහල දරු දැරියන් ගේ සහභාගීත්වය වැඩි විය. විෂයානුකූලව සිංහල භාසාව ඉගැන්වීමට නොහැකි වූවත්, කවියත් ගීයක් කතන්දරයක් කියවීමට මෙන්ම සිංහල යනු කුමක්ද යන්න දරුවෝ මේ තුළින් හඳුනාගත්හ. පසු කාලයක මෙම පාසල් පද්ධතිය දිය නොවී රැක බලා ගැනීමට දායක වූවන් අතර දොස්තර සෙනෙවිරත්න බණ්ඩා, පාලිත ගනේවත්ත, සෑම් සමරසිංහ, ෂ්‍යාමා රත්නායක, අසෝක නානායක්කාර වැන්නවුන් ගෙන් ලද සහය හා ඔවුන් දැරූ වෙහෙස ඉතා අගය කළ යුතු ය.

පසු කලෙක පිහිටවූ ගුරු දෙගුරු සමිතියත්, සිංහල සංස්කෘතික හමුවත් හකතු වී පිහිටුවාගත් අධ්‍යාපන කමිටුව මගින් විනයානුකූලව සකස්කරගත් විදිමත් විෂය මාලාවක් අනුව අද මෙම සිංහල පාසල්වල කටයුතු කෙරීගෙන යයි. පාසල පටන්ගත් මුල් අවධියේ පටන්ම දරුවන්ගේ කලා කුසලතා ඔප් නැංවීමට වසරකට වරක් සංවිදානය කළ විවිධ ප්‍රසංගය මේ වනතුරු නොඩවා පැවැත්වීම තුළින් විවිධ දස්කම් හඳුනාගෙන ඔවුනට අත දීම මහඟු කාර්යයකි. එදා වැත්වූ මුල්ම විවිධ ප්‍රසංගය නැරඹූ දෙමාපියන්ගේ නෙතට සතුටු කඳුලු ගලා ආවේ එහි ප්‍රගිඵලයක් ලෙසය.

නිව් සවුත් වේල්ස් රජයේ ආදාර වැඩ සටහන් යටතේ ගුරුවරු පුහුනු කිරීම, වැඩමුළු පැවැත්වීම, අධ්‍යාපන ක්‍රම විධි පිළිබඳව පුහුණුවක් ලබා දීම සිදු කෙරුණි. එය පාසලේ වර්ධනයට බොහෝ උපකාරී විය. උතුරු පරමටා මව් පාසලෙන් ආරම්භ කළ සිංහල පාසල ඇරුණු කොට ශාන්ත මේරීස් හා මින්ටෝ සිංහල පාසල් ද අමෙමගින් පවත්වාගෙන යන අතර මේ සියලු පාසල් වලින් දරුවන් 200 ක් පමණ සිංහල භාෂාව උගනියි. මෙහි කැපී පෙනෙන අනෙක් කාරණය වන්නේ මෙම සිංහල පාසල් තුළින් අධ්‍යාපනය මැදෑරූ දැනට උසස් අධ්‍යාපනය ලබන"ආදි සිසු සිසුවියන් විසින් පිවිටුවා ගෙන ඇති තරුණ හමුවයි. ඔවුහු මෙම හමුව මගින් ආගමික මෙන්ම සංස්කෘතික වශයෙන් ද අපේ දරු කැලට මහඟු සේවයක් ඉටු කරති. ඔවුන් විසින් මෑතදී සංවිදානය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රෞඪ ඉතාහාසය විදහා දක්වන මහාවංශ වැඩ සටහන එයට දිය හැකි හොඳම උදාහරණයයි.

තව දුරටත් රජයේ ආදාර ලබා ගනිමින් මෙම පලසන සේවාව වැඩි දියුණු කිරීමට නම් දරු දැරියනගේ සහභාගීත්වය නොකඩවා සිදුවිය යුතු අතර මෙරටට සංක්‍රමණය වන අළුත් පරපුරේ ද සහයෝගය නොකඩවා ලැබිය යුතුය.

(මෙම ලිපිය සකස් කිරීමේදී කරුණු සොයා දුන් අතුල ගිනිගේ හා අජිත් ලක්ෂ්මන් යන මහත්වරුන්ට ස්තුතිය පුද කරමි)

## කෑමට පසු.....

අසද්සදකොරොස් ලියයි







**වෛර නොකිරීම උතුම් ගුණයකි**

නහ වේරේන වේරානි-
සම්මන්තීධ කුදාචනං
අවේරේන ච සම්මන්නි
ඒස ධම්මෝ සනන්තනෝ

මේ ලොව වෛරයෝ වෛරයෙන්
කිසිකලෙක නොසන්සිදෙත්.
මෛත්‍රියෙන්ම සන්සිඳෙත්
මෙය සදාතනික දහමකි.

Nahi verena verani-
sammanti'dha kudacanam
Avereacha sammanti-
esa dhammo sanantano

**Anger is conquered by love .**

Hatreds never cease through hatred in this world. Through love alone they cease. This is an eternal law.

නිදානය-

**නපුරු පැතීමක් ඉටුවීම**

සැවැත් නුවර එක් තරුණයෙක් පියාගේ වියොවින් පසු තම වතු පිටි දියුණු කර, ධනය රැස්කර ගනිමින්, තම මවද රැක බලා ගෙන වාසය කය-ය. හේ ගුණ යහපත් පුතෙකි. කීකරුව ලෙන්ගතුව වැඩෙන පුතු ගැන සිතූ මව ඔහුට විවාහයක් කර දීමට තීරණය කළා ය. පුතුගේ එතරම් කැමැත්තක් නුවුනත් පුතු කැමති කරවා ගත් මව පුතුට ගැලපෙන විවාහයක් කර දුනි. කල් ගත වුවත් දරු පල නොදැරූ හෙයින් ඈ වඳ ස්ත්‍රියක් බව මව දැන ගත්තාය. දරු නැති කුලය හා ධනය නැසෙතැයි සිතූ මව පුතුට තවත් විවාහයක් කර දීමට සිතීය. පෙර බිරිඳ මේ බව දැන තමාට අවනතව සිටීමට අළුත් බිරිඳ කැමති නම් පමණක් අවසරය ලබා දුන්නාය. මව තම පුතුට තව විවාහයක් කර දුනි. බිරින්දෑ වරු දෙදෙනාම හිමිද සමග එකට විසූහ. පසු කලකදී පළමු බිරිඳගේ සිත නොසන්සුන් විය. ඒ අනික් ස්ත්‍රියට දරුවන් ලැබුණොත් ගේ දොර වතු පිටි මුදල් සියල්ලම අයිතිය හිමි වන්නේ ඇයටය.තමාට විපතක් වෙන්නට හැකි බව සිතීය. කල් ඇතිවම එයට පිළියම් යෙදීමට සිතා අළුත් බිරිඳ සමඟ බොහෝ ලෙන්ගතුව දරුවකු ලැබෙන බව දැන ගත් පසු තමාට දන්වන්නැයි කීය. දෙවන බිරිඳට දරුවකු ලැබුමට ලකුණු පහළ වූ පසු ඒ බව පළමු බිරිඳට දන්වන ලදී. එවිට පළමු බිරිඳ ආහාර සමඟ දරු ගැබ වැටෙන්නට බොහෙත් ආහාර සමඟ කලවම් කරදී දරුපල නැති කළහ. මේ බව තේරුම් ගත් දෙවන බිරිඳ තුන්වන දරු ගැබ හටගත් කළ ඒ බව අර වඳ ස්ත්‍රියට නොදැන්වීය. මුහුකුරා එන දරු ගැබ සහිත උදරය දුටු වඳ ස්ත්‍රියට තරහ සිත ඇති වී පෙර සේ ආහාරයට ගබ්සා බෙහෙත් යොදා දුනි. දරු ගැබ මෝරා තිබූ බැවින් නොවැටී කුස තුල දරු මරණය සිදුවිය. මවද මිය යන මොහොතේ, තී මාගේ දරු දෙදෙනෙක්ම පළමු නැසීය. දැන් මේ කුස බිළිදා හා මමත් නැසීමට සලැස්වුහ. මිමද මතු යකිනියක්ව ඉපිද තීත් තිගේ දරුවනුත් නසිම්යි ශාප කර මරණයට පත්විය.

ඒ පැතුම පරිදි ඔවුන් දෙදෙන බොහෝ නොයෙක් අත් බැව්හිදී ඉපිද දරුවන් සමඟ විනාශයට පත් වූහ. අප බුදුරදුන් කළද යකිනියක්ව ඉපිද ඇගේ දරු දෙදෙනෙකුම නැසුයේය. තෙවන දරු සිගිත්තා බුදුහිමියන් බේරා දී වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව වදාරා ඔවුන් දෙදෙනා සමගියෙහි පිහිටුවා වෙර සංසිඳවූ සේක.